# 10 ශ්‍රේණිය
# ඉතිහාසය

## ක්‍රියාකාරකම් පත්‍රිකාව පිළිතුරුපත්‍රය

## ඒකකය 2
## ශ්‍රී ලංකාව ජනාවාස වීම -02







## පූර්ව ඓතිහාසික යුගය

අයි.එම්.ධම්මික කුමාර ඉලංකෝන් (ගුරු උපදේශක)
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල

# පූර්ව ඓතිහාසික යුගය

1.ඉතිහාසය පෙළ පොත හා මෙම පාඩමට අදාළ කියවීම් පත්‍රිකාව හොඳින් කියවා පහත සඳහන් ක්‍රියාකාරකම් වල නිරත වන්න. නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

01. ශ්‍රී ලංකාවේ යකඩ භාවිතය පිළිබඳව මුල්වරට පැහැදිලි පුරාවිද්‍යාත්මක සාධක හමු වන්නේ,

1. ප්‍රාග් ඓතිහාසික යුගයේ දීය. 2. පූර්ව ඓතිහාසික යුගයේ දීය.
3. මුල් ඓතිහාසික යුගයේ දීය. 4. ඓතිහාසික යුගයේ දීය.

02. දඩයමින් ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයා, ගොවිතැන කෙරෙහි යොමු වීමට බලපෑ මූලික පරිසරාත්මක හේතුව මින් කුමක්ද?

1. පසෙහි සාරවත් බව වැඩිවීම.
2. දඩයමට සුදුසු සතුන් හිඟවීම.
3. පැවති ශීත දේශගුණය වෙනස් වී උණුසුම් දේශගුණයක් ඇරඹීම.
4. ජන සංඛ්‍යාව වැඩිවීම හා ව්‍යාප්ත වීම.

03. දඩයම් යුගය අවසානයේ ස්ථිර ජනාවාස හා වාසස්ථාන ගොඩනගාගත් බවට පැහැදිලි නිවාස අවශේෂ සොයා ගෙන ඇති ගම්මානය වන්නේ මින් කුමක් ද?

1. ඉබ්බන්කටුව 2. උඩරංචාමඩම 3. පාහියන්ගල 4. සීගිරියේ පොතාන

04.ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය සම්බන්ධයෙන් පැරණිතම තොරතුරු ලැබෙන ස්ථානයකි.

1. පාහියංගල 2. ඉබ්බන්කටුව 3. බෙරගල 4. කළඹටුවාව

05. ලෝකය තුළ කෘෂිකර්මාන්තයට උචිත පරිසරයක් ගොඩනැගුන යුගය කුමක් ද?

1.මෙගලිතික යුගය 2.පැලියෝලිතික යුගය
3. ප්ලයිස්ටොසීන යුගය 4. හොලෝසීන යුගය

06. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය පිළිබඳ පැහැදිලි සාධක බහුලවම හමුවන ප්‍රදේශය වන්නේ

1. සපරගමු පළාතේ ඊසාන දිග කොටසින් හා ඌව පළාතේ නිරිත දිග කොටසින් ය.
2. ඌව පළාතේ ඊසාන දිග කොටසින් හා සබරගමු පළාතේ නිරිත දිග කොටසින් ය.
3. උතුරුමැද පළාතේ දකුණු කොටසින් හා වයඹ පළාතේ ඊශානදිග කොටසින් ය.
4.නැගෙනහිර පළාතේ බටහිර දෙසින් හා සබරගමු පළාතේ ඊශානදිග කොටසින් ය.

**07.** යාපහුව ගල් සොහොන්කනත්ත අයත් වන්නේ කුමන සුසාන වර්ගයකට ද?

**1.**මැටි ඔරු **2.** විස්කෘත **3.** ශිලා මංජුසා **4.** හරණී

**08.** මහා ශිලා සුසාන සම්ප්‍රධායට අයත් පැරණිතම සුසාන ක්‍රමය කුමක් ද?

**1.**මැටි ඔරු **2.** විස්කෘත **3.** ශිලා මංජුසා **4.** හරණී

- ඡායාරූප ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**01.**



I. මෙම ඡායාරූපයෙන් දැක්වෙන සුසාන වර්ගය කුමක්ද?

ශිලාමංජුසා සුසානය

II. මෙම සුසාන කුමන සම්ප්‍රධායකට අයත් ද?

මහාශිලාසුසාන

III. මෙවැනි සුසාන දැකිය හැකි ස්ථානයක් නම් කරන්න.

ඉබ්බන්වුව, යාපහුව ගල්සොහොන් කනත්ත

IV. මෙහි ඇති මැටි බඳුන් වල තැම්පත් කර ඇත්තේ මොනවා ද?

භෂ්මාවශේෂ

**02.**



I. මෙම බඳුන හමු වූ ස්ථානය කුමක් ද?

උඩරංචාමඩම නේවාසික ප්‍රදේශය

II. මෙම බඳුන අයත්වන යුගය කුමක් ද?

පූර්ව ඓතිහාසික යුගය

III.මෙම මැටි බඳුනේ ඇති විශේෂත්වයක් ලියන්න

නිපදවීම සඳහා සකපෝරුව භාවිතාකර ඇත වර්ණකර ඇත

IV. මෙවැනි මැටි බඳුන් පොදුවේ හඳුන්වන නම කුමක් ද ?

කාලරක්තවර්ණ මැටිබඳුන්

- පහත සඳහන් ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

01.

I. a. පූර්ව ඓතිහාසික යුගය හැඳින්වීම සඳහා භාවිතා කරන වෙනත් නමක් ලියන්න.

මුල් යකඩ යුගය

B. ලංකාවේ පූර්ව ඓතිහාසික සම්බන්ධයෙන් පැහැදිලි සාධක හමුවන ප්‍රදේශ දෙකක් නම් කරන්න.

සබරගමු පළාතේ ඊසානදිග කොටසෙන් සහ ඌව පළාතේ නිරිතදිග කොටසෙන්

II. පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික ගල් යුගයෙන් වෙන් කර හඳුනාගත හැකි වෙනස්කම් 04 ක් නම් කරන්න.

සංචාරී ජීවිතය ක්‍රමයෙන් අතහැර ස්ථිරවාසීතාවයට හුරුවීම

නිවාස ඉදිකිරීම ,ස්ථිර ජනාවාස බිහිවීම

දඩයම හා වන ද්‍රව්‍ය රැස් කිරීම අතහැර ක්‍රමයෙන් කෘෂිකර්මාන්තයට හුරුවීම.

ශිලා මෙවලම් භාවිතය ක්‍රමයෙන් අතහැර යකඩ මෙවලම් භාවිතයට හුරුවීම.

පිලිස්සූ මැටි වළං භාවිතය.

ක්‍රමවත් සුසාන ක්‍රම භාවිතා කිරීම.

III. පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ සුසාන ක්‍රම පිළිබඳ උදාහරණ සහිතව විස්තර කරන්න.

IV. පූර්ව ඓතිහාසික යුගයේ මානවයා ක්‍රමවත් සුසාන ක්‍රමයන් භාවිතා කළ අතර එහිදී ඔවුන් සිදුකර ඇත්තේ භෂ්මාවශේෂ තැම්පත් කිරීමේ ක්‍රමයන්ය. මෙම යුගයේ මානවයා භාවිතා කළ සුසාන ක්‍රම රැසක් පිළිබඳ පුරාවිද්‍යාත්මක සාදක හමු වී ඇත. මෙහි විශේෂත්වය වන්නේ ලෝකය පුරාම මෙම යුගයේ දී එක හා සමාන සුසාන ක්‍රමභාවිතා කර තිබීමයි.

ශිලා මංජුසා ක්‍රමය

මැටි ඔරු සුසානය

භරණී ක්‍රමය

විශාල ශිලා පදනම් කරගනිමින් මළවුන් වෙනුවෙන් සොහොන් නිර්මාණය කිරීම පූර්ව ඓතිහාසික සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණය විය. දැනට පූර්ව ඓතිහාසික යුගයට අයත් සොහොන් බිම් 50කට වැඩි ප්‍රමාණයක් සොයා ගෙන ඇත .මියගිය අයගේ භස්මාවශේෂ ඔහු භාවිත කළ උපකරණ හා ආහාර ද්‍රව්‍ය කුඩා හෝ විශාල හෝ මැටි බඳුන් තුළ බහා විශාල පාෂාණ පතුරුවලින් ආවරණය කිරීම ප්‍රධාන චාරිත්‍ර විධිය වූ බවට සාධක ඇත. වාර්තා වී ඇති වැඩි ප්‍රමාණය ශිලා මංජුසා සොහොන්, බරණී සොහොන් සහ මැටි ඔරු සොහොන්වේ. මෙම සුසාන ක්‍රම අතරින් වඩාත් පැරණිතම සුසාන ක්‍රමය ලෙස හඳුනාගෙන ඇත්තේ මැටි ඔරු සුසානය. ශිලා මංජුසා සෙහොන් යනුවෙන් හැඳින්වෙන්නේ ගල් පතුරු 4ක් හතර අතට තබා ඒ තුළ භස්මාවශේෂ සහිත බඳුන් තැන්පත් කොට උඩින් පැතලි ගල් පුවරුවකින් ආවරණය කිරීම යි. මෙම ක්‍රමයේසොහොන් ඉබ්බන්කටුව, යාපහුව ගල් සොහොන් කනත්ත ,ගලේවෙලට නුදුරුව පිහිටි යටිගල්පොත්ත , රඹෑව, යාන්ඔය

නිම්නය ආදි ප්‍රදේශවලින් හමු වී ඇත. බරණී සුසාන ක්‍රමයට අනුව විශාල මැටි බඳුන් තබා ඒ තුළ කුඩා මැටි බඳුන් තැන්පත් කොට ගල් පියස්සකින් ආවරණය කෙරේ. මෙම වර්ගයේ සොහොන් පොම්පරිප්පුවෙන් හමු වී ඇත. මැටි ඔරු සුසාන ක්‍රමයේදී මැටිවලින් නිර්මාණය කරන ලද ඔරුවකට සමාන නිර්මාණයක් තුළ දේහය හෝ ඇටසැකිළි බහා ආදාහනය කර තිබේ. මෙම වර්ගයේ සොහොන් රංචාමඩම, නිකවලමුල්ල, හල්දූම්මුල්ල යන ප්‍රදේශ වලින් හමු වී ඇත.

V. **පූර්ව ඓතිහාසික යුගයේ මානවයා තාක්ෂණය භාවිතා කළ ආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න.**

පූර්ව ඓතිහාසික යුගයේ තාක්ෂණය පිළිබඳ තොරතුරු අනාවරණය වන අවස්ථා

යකඩ මෙවලම් තනාගැනීම

වරිච්චි නිවාස ඉදිකිරීම

පොළොව මත ගල්කැබලි අතුරා සවිමත් කොට ඒ මත මැටි අතුරා එම නිවසේ ගෙබිම ඉදි කර තිබිණි. එහි බිත්ති ගොඩ නගන ලද්දේ වරිච්චි මැටිවලින් බව තහවුරු වූයේ පිලිස්සී ගිය වරිච්චි මැටි කැබලි සොයා ගෙන තිබෙන නිසා ය. ඒ නිවසේ ඉදිරිපස සහ පිටුපස වශයෙන් කොටස් දෙකක් වෙන් කිරීමට නිවස මැදින් බිත්තියක් ඉදි කර තිබිණි. එහි සවි කර තිබූ දැවමය දොර උ`එවස්ස සවි කළ සිදුරුල කැණීෙමේ දී සොයා ගෙන තිබේ. මෙලෙස අත්තිවාරමක් මත බිත්ති ගොඩ නගා ඒ මත වහලක් සවි කර කාලයක් පවතින ලෙස නිවසක් ඉදි කිරීමට තාක්ෂණික දැනුමක් අවශ්‍ය ය.

සකපෝරුව යොදාගෙන මැටිබඳුන් නිපදවීම වර්ණ කිරීම හා පිළිස්සීම

සකපෝරුව නමින් හැඳින්වෙන සරල යන්ත්‍රය මැටි බඳුන් තැනීමට භාවිත කර තිබේ. සකපෝරුව යනු කරකැවීමට හැකි වෘත්තාකාර ලෑල්ලකි. ඉතා උසස් නිමාවකින් යුත් මැටි බඳුන් සෑදීමට නම් ඉතා හොඳින් මැටි පදම් කර සකස් කර ගත යුතු ය. භාජනයක් සෑදීමට සුදුසු මැටි වර්ග සොයා ගැනීම, ඒවා පදම් කර ගැනීම, පිලිස්සීමට උදුනක් තනා ගැනීම, නියමිත උෂ්ණත්වයට බඳුන පුලුස්සා ගැනීම ආදී ප්‍රායෝගික පියවර කිහිපයක් පිළිබඳ මනා දැනුමක් ඊට අවශ්‍ය ය

සුසාන ඉදි කිරීම

මැටි පබළු නිපදවීම

මෙම සෑම ක්‍රියාවක් සම්බන්ධයෙන්ම තාක්ෂණික භාවිතය පිළිබඳ තොරතුරු උඩරංචාමඩම නේවාසික ප්‍රදේශයේ කැනීම් මඟින් තහවුරු වී ඇත.

- පහත සඳහන් ස්ථාන ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

උඩරංචාමඩම, ඉබ්බන් කටුව , පොම්පරිප්පු , බෙරගල , හල්දුම්මුල්ල ,යාපහුව ගල්සොහොන් කනත්ත ,යටිගල්පොත්ත

